# බළන්ගොඩ නගර සභාව
# ටෙන්ඩර් දැන්වීම

**බළන්ගොඩ නගර සභාවට අයත් මහජන පොළ ආපනශාලාව සහ පොළ කඩ අංක 18 දරන පොළ කඩ කාමරය සඳහා සුදුසු බදු කරුවන් තෝරා ගැනීම වෙනුවෙන් ටෙන්ඩර් පත් කැඳවීම.**

මහජන පොළ ආපනශාලාව 2023 දෙසැම්බර් මස 01 වන දින සිට 2024 නොවැම්බර් මස 30 වන දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා ද, අංක 18 දරන පොළ කඩ කාමරය 2023 ඔක්තෝබර් මස 21 වන දින සිට 2024 ඔක්තෝබර් මස 20 වන දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා ද, පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන දේපළ බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ඩ්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මා විසින් 2023 ඔක්තෝබර් මස 20 වන දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දි කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබාගත හැකි ය.

**ටෙන්ඩර් පත් නිකුත් කිරිම:**

2023 ඔක්තෝබර් මස 19 වන දින ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දි නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් භාරගැනීම:**

2023 ඔක්තෝබර් මස 20 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ **ලේකම්, බළන්ගොඩ නගර සභාව** යන ලිපිනයට 2023 ඔක්තෝබර් මස 20 වන දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් විවෘත කිරිම:**

2023 ඔක්තෝබර් මස 20 වන දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැකිය.

**උප ලේඛනය**

| අනු අංකය | ටෙන්ඩර් පත් කැඳවනු ලබන වෙළෙඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම මාසික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 01. | මහජන පොළ ආපනශාලාව | රු. 5,000.00 | රු.1,000.00 | රු.15,000.00 |
| 02 | අංක 18 පොළ කඩ කාමරය | රු. 5,000.00 | රු.1,000.00 | රු. 2,500.00 |

විශේෂ කොන්දේසි:

- ✓ ටෙන්ඩර් අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමේදී, ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ තමා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතුය.
- ✓ ඉදිරිපත් කරන ටෙන්ඩරයේ මුදලට හා ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු සඳහා රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- ✓ තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගැනීමෙන් පසු පළමු පැය තුළ ගෙවිය යුතු ය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුලිය එකවර ගෙවා මහජන පොළ ආපනශාලාවේ ගිවිසුම 2023.11.30 දිනට පෙර අත්සන් කළ යුතු අතර පොළ කඩ අංක 18ට අදාළ ගිවිසුම 2023.10.20 දිනට පෙර අත්සන් කළ යුතුය.
- ✓ සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බලංගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.
- ✓ ටෙන්ඩර් කොන්දේසි සහ විස්තර ටෙන්ඩර් අයදුම් පත්‍රය සමඟ ලබාදෙනු ලැබේ.
- ✓ වැඩි විස්තර සඳහා සතියේ දිනවල කාර්යාල වේලාව තුළදී විමසිය හැකි ය.

2023 ඔක්තොම්බර් මස 04 වන දින,
බලංගොඩ නගර සභාවේදීය.

එස්.එච්.ඒ. කරුණාරත්න,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව